# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2449/27 - 2025 අගෝස්තු මස 13 වැනි බදාදා - 2025.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 16/2016 (A)

**(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත**

21 වන වගන්තිය යටතේ වන නියමය

(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, අනුර කුමාර දිසානායක වන මා විසින්, ජාතික සුභසිද්ධිය සඳහා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, නාවික නොවන කාර්යයන් ලෙස, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයන්ට, වෙළඳ නෞකාවන්ට ආරක්ෂක සේවා සපයනු ලබන විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම් වෙත එහි සේවා හා පහසුකම් සැපයීම සඳහා සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම, එම ව්‍යාපෘතියේ සියලුම මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සුදුසු පරිදි සිදු කිරීම පිණිස, විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි, උණ්ඩ සහ අනෙකුත් උපාංග ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් අවි ගබඩා තුළ ගබඩා කිරීම සහ එකී ගිනි අවි, උණ්ඩ සහ අනෙකුත් උපාංග මෙහෙයුම් අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම්වල දේශීය නියෝජිතයන් විසින් සපයනු ලබන වාහන හෝ යාත්‍රා උපයෝගී කර ගනිමින් ප්‍රවාහනය කිරීම ඇතුළුව ඉහත කාර්යයන් හා සම්බන්ධිත හෝ ඊට ආනුශංගික සියලු කාරණා ඉටු කරන ලෙස මෙයින් නියම කරනු ලැබේ.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2025 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0133

1A - G 45111 — 05 (2025/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*